පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**UNIVERSITY OF PERADENIYA**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2018 (දෙසැම්බර් 2018)**
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2018( December 2018 )

**19වන සියවස තෙක් සිංහල සාහිත්‍යය සහ නාට්‍යය**

**(Sinhala Literature and Drama up to the 19th Century)**

**SINE 102**

**කාලය පැය තුනයි (03).**

**පළමුවන ප්‍රශ්නය** හා **හතරවැනි ප්‍රශ්නය ඇතුළත්ව,** ප්‍රශ්න පත්‍රයේ ඇති කොටස් දෙකෙන් සෑම කොටසකින්ම **ප්‍රශ්න දෙකක්වත්** ඇතුළත්වන සේ ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (08) අටකි. නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

## I කොටස

1. (අ) පහත සඳහන් ගද්‍ය පාඨය ලිහිල් බසින් ලියන්න.

> එක් බාල නමෙක් කරණ ලෙසින් ම සැක ඇති ව විමසනු නිසා වස් ගණන් විචාරා වස් ගණන් කියන්ට නැත. වැඩි මාලු කල මහණ වූමෝහ'යි කී කල් හි 'හැයි නො හික්මුණු මාල්ලණුවෙනි, වයසින් වැඩි මාලු වුව ත් පැවිද්දෙන් තමන් බාල නියාව නො-දන්නා නියා ද? වැඩි මාලු වහන්දෑ දුටු කල බිම හස්නෙක හුන ත් නැඟී සිටිනා ආකාර දක්වා අවසර ලදින් හුන මනා නැනා සසර බැඳ රඳවන්නට හිඳවා ලූ කණුවක් සේ නැඟී නොසිට හිඳින්-නේ ත් හැයි ද? විවාළ දෙයට බැණ නොනැහෙන්ට යුක්තියකු ත් මේ බුදු සස්නෙහි ඇද්ද? සෙසු වහන්දෑ කරණ ලෙස තමන් ඇසට නො පෙනෙන නියා ද? උසින් මහතින් මහත් බව මුත් කට යුත්තෙන් මහත් නො වන්ට කාරණ කිම දැ'යි සකාරණ කොට බොහෝ දෑ කී සේක. එ කල්හි පුල්ලතිස්ස තෙරුන් වහන්සේ ගුණයක් නිසා සැබෑ ගුණයක් වී නම් උපදනා අභිමාන නැති හෙයින් රජ කුලෙහි උපන් හෙයින් ජාති ය නිසා අභිමානයක් උපදවා තමන් හැම යන්නේ කවුරුන් ළහට දැ'යි විචාරා බුදුන් ළහට ය යි කී කල්හි එ සේ කල තමන් හැම මා ගේ තරම් නො-දන්ට කාරණ කිම ද, මම තමන් හැම දෙනා ගේ බුදුන්ට අවශ්‍ය යෙමි. තමන් හැම ගේ ත් අවශ්‍ය කමෙක් ඇද්ද? තමන් ගේ බුදුන් ගේ පිය රජ්ජුරුවෝ ත් අපගේ මෑණියෝ ත් දෙ බීන්නෝ ය; අප ගේ තරම් නො දැන තමන් හැම අපට දෙඩූ සැටියට බුදුන් ගේ නෑ කම් සැබෑ වී නම් අද කියට් කියවම්'යි බුදුන් කුමක් වදරණ බවත් නොදන ම නියං සමයේ හඬන ආසක් මෙන් ගර්ජනා කොට ගෙන හඬමින් වලපමින් බුදුන් කරා ගිය සේක.

(**සද්ධර්මරත්නාවලිය**, කිරිඇල්ලේ ඥානවිමල සංස්: 94 පිට)

(ආ) **සද්ධර්මරත්නාවලි** කතුවරයා, ගැමි සිතුම් පැතුම් ඉතා නිර්ව්‍යාජව චිත්‍රණය කළ ආකාරය පැහැදිලි කරන්න.

(අනෙක් පිට බලන්න)

2. **"ධර්මප්‍රදීපිකාව** අර්ථ ව්‍යාඛ්‍යාන කෘතියක් වුවද, එහි ඇතැම් කොටස් නිර්මාණාත්මක ලක්ෂණවලින් අනූනය." නිදසුන් දෙමින් මේ අදහස පැහැදිලි කරන්න.

3. (අ) පහත දැක්වෙන ගද්‍ය පාඨය ලිහිල් බසින් ලියන්න.

අඟුල්මල් සොරහු දමූ පරිදි කියේ ය යත් කොසොල් රජහුගේ භාගීව නම් පුරෝහිතයා පිණිසැ මන්තාණි නම් බැමිණි ගබ් ගෙන රෑ පුතකු[1] ප්‍රසව කළා. ඔහු මවුකුසින් නික්මෙන කල සියලු නුවර රජුන්ගේ[2] ආයුධ දිලිණ. රජුගේ යහන්හි තුබූ මඟුල්කඩුව ද සෙසු අවි දු දිලිණ. බමුණු නික්ම නකත්තරු බලන්නේ සොරනකතින් උපන්බව් දැනැ රජු කරා ගොස් දවස් ගිය සේ සුව දැ යි පිළිවිත. රජ, දවස් ගිය සේ නොසුව ය. රෑ මාගේ මඟුල් අවි දිලිණ. රජයට හෝ දිවියට හෝ අන්තරාය වෙ යි යන සිතින් නිදි නොලත්මි කී යැ. මහරජ, නොබව. මාගේ ගෙහි කුමරෙක් උපන. උහුගේ ආනුභාවයෙන් තොපගේ මතු නොවෙයි. සියලු නුවරැ ආයුධ දිලිණැ යි කී යැ. රජු එකල්හි කිමෙක් වෙ යි පුළුවුත්තෙන් සොරෙක් වෙ යි කී යැ. එක සොරෙක් වෙයි හෝ බොහෝ සොරුන් ගෙන රට පහරනට තිසි සොරෙක් වෙයි හො යි කී යැ. එක සොරෙක් වෙයි, මහරජ යි කී යැ. එසේ කියා තමා[3] රජු සිත් ගන්නා සඳහා උහු හැරපිය මැනැවැ හො යි කී ය. එක සොරකු බැවින් කුම් කෙරෙයි. පිළිදගුව ඔහුය යි කී ය. ඔහු නම් තබන්නාහු සියලු නුවරැ දිලියෙන ආයුධයෝ කිසි කෙනක්නට හිංසා නොකළහ යි අහිංසක නම් තුබූහ.

( **අමාවතුර;** ප්‍රාචීන භාෂෝපකාර සමිති ප්‍රකාශනය, 102 පිට)

(ආ) **අමාවතුරේ** භාෂා රීතිය පිළිබඳ කෙටි රචනයක් සපයන්න.

4. (අ) පහත දැක්වෙන සීගිරි ගීවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

සිගිරි ගී - පෙළ

12. (බ)ලත් පොඇල්මි මයි ගි
බෙයන්ද්හි දිග්නෙත් මහ වන්
හෙළිල්ලබුයුන්
අවු(ජ් තුව්) සිත් කළ මරණෙක්
දුකැ නො මුස්නෙය් මය්

13. (සව)(සති)
සිතිත්ද් (පැ)හැබර් රතත්
නි(ලු)පු(ල්) ම(ල)ක් ඉසුළු
බෙයන්ද්හි රත්වනක් ගත මත
මය් එකිත් නොරය්

14. සවසති සමතල ගි
බලත් නැගියුන හය් නො මෙ
(බැණැ) හිඳිමින් ව(ජ)න්
සිරි(බරි)න් තම වෙත සිකි
හජනෙ හිමියබි බෙයන්ද්හි

15. (1) (සවසති)
(උ)තුර්පස්වැසි සමතලබතිම් (ෙ)ම ගි ලිමි
(අ)රත අවුජ් බෙයදහිර නැගල
ඇ(ති ප)වසයෙහි
(2) පියසිති (එ)වත්නෙහි එනො
සිහිනෙසිති දුටුයයුත සෙසි

16. පොතකි (වෙ)ණද (නි)ස(හු) ගී
දසදන ආ ද අලි දිසි රජ වි සිති සෙබවින
ගලි කල(ළ) බෙයදහි (වෙස වි) ද
තද අසර(යට) නිපි

(සීගිරි ගී, නන්දසේන මුදියන්සේ සංස්: 28,30, 31 ගී)

(අනෙක් පිට බලන්න)

(ආ) ක්ෂණික හැඟීම් ප්‍රකාශිත භාව ගීතාවලියක් ලෙස සීගිරි ගී අගය කළ හැකිදැ'යි විමසන්න.

## I I කොටස

5. (අ) පහත දැක්වෙන ගී ලිහිල් බසින් ලියන්න.

287

පිළිබිඹු නොතුපුලොත නරනිඳු ලැදිපියක[1] දුන්
ඊහිවිතැ යෙහෙන් දිස්නා උව්නත මත්[2] සොළෙ[3] පටින්

288

නැත ද සෙස් පිළිමිණි විත් කතක[1] ඊහිමත්[2]
නහා දෙත සිනෙ[3] රජ රජ් ලද බිසෙව් සිරි හා

289

පැසි හිඟුරු අමද[1] පලහා කට මී මියුරු
බමත[2] ඇතොරන් බී සියලඟැ[3] මද බුමුත්[4] වන්

290

සැහැ බඳ මැසි පියන් මී බොත විත[1] තුබූ සෙස්
සිරි ලද මෙද ළසඳ ඉඳු පෙබයී[2] හා මන කුමුදු

291

සැකී දල මහනෙල් නෙත් පිළිබිඹු විත්හි
පුඹුතු මතෙයෝනත්[1] නරනිඳු සිනෙන් බිජී

( **කව්සිළුමිණ;** එම්. බී. ආරියපාල සංස්. 287 -291 ගී. )

(ආ) කව්සිළුමිණෙහි අලංකාර භාවිතයෙහි ස්වරූපය හා රස ජනනය කිරීමෙහිලා උපයුක්ත ශිල්පක්‍රම පිළිබඳ ඔබේ අදහස් සමාලෝචනය කරන්න.

6. එක්කෝ,

'**බුදුගුණාලංකාරය** රචනා කරන ලද්දේ යුගයෙහි ප්‍රචලිතව පැවති මිථ්‍යා විශ්වාස ඛණ්ඩනය සඳහාය.' **විමසන්න.**

නැත්නම්,

'**ගුත්තිල කාව්‍යයෙන්** පිළිබිඹු වන්නේ හුදු සාම්ප්‍රදායික කථා පුවතක් නොව, පරම්පරා දෙකක ආකල්ප පිළිබඳ විෂමතාවයි' සාකච්ඡා කරන්න.

7. "වර්ණනා චාතුර්යයෙන් අනූන මයූර සංදේශය ශබ්ද රසයෙන්ද පරිපූර්ණය." මේ අදහස සමාලෝචනය කරන්න.

8. සිංහල ගැමි ශාන්තිකර්මවල දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ පිළිබඳ නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)